# නර්තනය - 6 ශ්‍රේණිය

(දෙවන වාරය )



The National e-learning Portal for the General Education

නිපුණතා මට්ටම - 6.2
ක්‍රියාකාරකම - සෙම්බු , කෝලාට්ටම් නර්තන හඳුනා ගනිමු.



## ගැමි නැටුම් යනු කුමක්ද ?

- ගැමි ජනතාවගේ විවිධ ජීවන වෘත්තීන් හා අත්දැකීම් අනුව ගැමි නැටුම් නිර්මාණය වී ඇත. ඒ ඒ රටවලට ආවේණික ලක්ෂණ පසුබිම් කර ගනිමින් ගැමි නැටුම් නිර්මාණය වී ඇත.ගැමි නැටුම් ලෝකයේ සෑම රටකම දැකිය හැකිය.

## ගැමි නැටුමක සුවිශේෂ ලක්ෂණ

- සරල බව
- සාමූහික සහභාගීත්වය
- ඒමකම
- සමානාවය

| සිංහල ගැමි නැටුම් | දෙමළ ගැමි නැටුම් |
|---|---|
| කළ ගෙඩි නැටුම | සෙම්බු / චෙම්බු නැටුම |
| ලී කෙළි නැටුම | කෝලාට්ටම් නැටුම |
| | ( ද්‍රවිඩ ගායනා භාවිතා ගනියි. ) |

### සිංහල ගැමි නැටුම්



කළ ගෙඩි නැටුම



ලී කෙළි නැටුම

### ද්‍රවිඩ ගැමි නැටුම්



සෙම්බු නැටුම



කෝලාට්ටම් නැටුම

## සෙම්බු නැටුමේ විශේෂ ලක්ෂණ

1. කාන්තාවන්ගේ සහභාගීත්වය මූලික වේ.
2. එදිනෙදා ජීවිතයේ පරිහරණය කරන සෙම්බුව නැටුම සඳහා භාවිත කරයි.
3. සරල ක්‍රියා ඇසුරින් නැටුම නිර්මාණය වීම.

උදාහරණ - වතුර ගෙන ඒම.
වතුර ඉසීම.

4. සරළ ගීත යොදා ගැනීම.
5. ඇඳුම් පැළඳුම් ද්‍රවිඩ සංස්කෘතියට ගැළපෙන සේ යොදා යොදා ගෙන තිබීම.
6. නැටුම නිර්මාණයේ දී සරල රංග රටා භාවිතා කර තිබීම.
7. මෙම නැටුම ඉදිරිපත් කිරීමට විනෝදයක් බලාපොරොත්තු වේ.

## කෝලාට්ටම් නැටුමේ සුවිශේෂ ලක්ෂණ

1. පැරණි ගැමි නර්තන අංගයකි.
2. කාන්තා,පිරිමි දෙපාර්ශවයම සහභාගී වේ.
3. ලී දෙක තාලයකට ගසමින් සරළ ගීතයකට අනුව සරළ පද යොදා ගනිමින් නටයි.
4. රංග රටා භාවිත කරන්නේ සරළ ඒවා ය.
5. ද්‍රවිඩ සංස්කෘතියට උචිත වූ රංග වස්ත්‍රාභරණ භාවිත කෙරේ.

❖ පින්නල් කෝලාට්ටම් යනු ද මෙම නැටුමට සමාන වූ නර්තනාංගයකි.

විශේෂ ලක්ෂණ -

- කණුවකට බඳින ලද ලණු පටි ලීයකට සම්බන්ධ කරමින් ලණුව වටේ රටා මෝස්තර වියමින් නර්තනය කරයි.
- ද්‍රවිඩ ආගමික උත්සවයක් වන තෛපොංගල් උත්සවය. ආදී සමාජ ආගමික උත්සව වලදී මෙය දක්නට ලැබේ.
- මෙම නැටුම රංග දැක්වීමේ අරමුණ ද විනෝදාස්වාදයයි.
- මෙම නැටුම සඳහා ද්‍රවිඩ සංස්කෘතිකයට උචිත රංග වස්ත්‍රාභරණ භාවිත කරයි.



පින්නල් කෝලාට්ටම්

දුවේ,පුතේ යම් දෙයක අනුකරණය අපේ ජීවිතයේ ඇතැම් අවස්ථාවල වෙනසක් සිදු කිරීමට මහත් පිටුවහලක් වේ.ඔයාලට හැකි නම් සෙම්බු , කෝලාට්ටම් ගීතයක් අහලා එහි නර්තනයන් නරඹා සරල මාත්‍රයක් (අඩියක්) නිර්මාණය කිරීමට උත්සාහ කරන්න.



## කයි පත්‍රිකාව

1) ද්‍රවිඩ ගැමි නැටුම් ලෙස ......................... හා ...........................හැඳින්විය හැකිය.

2) සෙම්බු නර්තනය සඳහා ...................... පමණක් සහභාගී වේ.

3) කණුවකට බඳින ලද ලණු පරි ලීයකට සම්බන්ධ කරමින් දක්වන ද්‍රවිඩ ගැමි නැටුම ......................වේ.

4) සෙම්බු නර්තනයේ දී භාවිත කරන රංග භාණ්ඩ .....................වන අතර කෝලාට්ටම් නර්තනයේ දී ..............භාවිත කරයි.

5) පින්නල් කෝලාට්ටම් නර්තනය ................... උත්සවය අවස්ථා වලදී දක්නට ලැබේ.


උපදේශකත්වය

එස්.එම්. ඩී.ජී. සේනානායක මයා (ස.අ.අ. නර්තන -ක.අ.කා හෝමාගම)

සැකසුම

පද්මිණී වික්‍රමසිංහ මිය (බප/හෝ/ මහින්ද රාජපක්ෂ විද්‍යාලය)

එම. අයි. එච්. පීරිස්. මිය (බප/හෝ/ මහින්ද රාජපක්ෂ විද්‍යාලය)



- **උපදේශකත්වය – එස්. එම්. ඩී. ජී .සේනානායක (ස. අ .අ. නර්තන ක. අ. කා. හෝමාගම)**

**සැකසුම - එස් ආර් ආර් ඩබ්.ඩබ්. එම්.පී.කේ. වික්‍රමසූරිය**